සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

07 ශ්‍රේණිය

# ඉතිහාසය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- **අංක 1 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01 ලෝකයේ පැරණිම ගොවිතැන් ක්‍රමය ලෙස .......................................... දැක්විය හැකිය.

( වී වගාව / හේන් වගාව / එළවළු වගාව)

02 අතීත සෙල්ලිපිවල හේනක් .................................................... ලෙස හඳුන්වා ඇත.

(සේන් / පිටබිම් / සාලි)

03 සීහළ වත්ථු නම් පැරණි ග්‍රන්ථයේ .......................................................................... පිළිබඳව දක්වා ඇත.

(කටුසර භෝග / හේන් / ඇල් වී)

04 සෑම ගමකටම එක් වැවක් තිබූ නිසා ................................................................. ලෙස ගමක වැව භාරව කෙනෙකු සිටි බව අතීත මූලාශ්‍රවල සඳහන් වේ.

(ගමික / ගම් වැව් / වපි ගමික)

05 අපේ පැරණි ජනයා කන්න තුනක් වගා කළ බව දක්වෙන්නේ ............................................... සෙල්ලිපියේය.

(සීහළවත්ථු / බදුලු / තෝනිගල)

- **අංක 6 - 10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුල යොදන්න.**

06 අතීතයේ මඩ ගොවිතැන බහුලවම සිදු කර තිබෙන්නේ වැසි ජලයෙනි. ( )

07 අනුරාධපුර රාජධානි සමයේ ගම් දහයකට එක් වැවක් බැගින් ඉදිකර ඇති බව පුරා විද්‍යාත්මක මූලාශ්‍ර වල දක්වා ඇත. ( )

08 අතීත ගොවීන් ලියදි සකස් කළේ හේන් ගොවිතැන සඳහා ය. ( )

09 ගිනියාතිකාව හේන්වල සිදු කළේ වන සතුන් පන්නා දැමීමටය. ( )

10 පුරාණ ගැමියෝ ගොයම් පාගා වී ලබා ගැනීම සිදු කළේ කමතේදීය. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

11 අතීත ජනයා සත්ව පාලනයේ දී කිරි ගෙරි ලෙස හඳුන්වා ඇත්තේ මින් කවරක් සඳහා ද?

(1) කිරි වලින් සාදා ගත් නිෂ්පාදන (2) කිරි ලබා ගැනීමට යොදා ගත් ගවයින්

(3) ගව පාලනය සඳහා යොදාගත් මිනිසුන් (4) මස් පිණිස ඇතිකළ ගවයින්

12 අතීතයේ ප්‍රවාහන ක්‍රමයක් ලෙස තවලම භාවිතා කළේ මින් කවර කරුණක් සඳහා ද?

(1) කරත්ත යොදා ගෙන භාණ්ඩ ප්‍රමාණය (2) මිනිසුන් ප්‍රවාහනයට යොදාගත් ගැල් බැඳි කරත්ත

(3) භාණ්ඩ හා මිනිසුන් ප්‍රවාහනය (4) ගවයින්ගේ පිටේ භාණ්ඩ රැගෙන යාම

13 1. තඹකර A දැකැති

2. ස්වර්ණකාර B මාල

3. ලෝකුරු C තඹ නිර්මාණ

ඉහත 1, 2, 3 යන පද සඳහා A, B, C පද වලින් නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර මින් කුමක් ද?

(1) A, B, C (2) B, C, A (3) C, B, A (4) C, A, B

14 අතීතයේ විසූ පෙහෙකාර නැමති ශිල්පීන් භාවිතා කළ ප්‍රධාන අමුද්‍රව්‍යය මින් කුමක් ද?

(1) උක් (2) කපු (3) මැටි (4) ලෝහ

15 අනුරාධපුරය හා මාගම යන නගර පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) අතීත වෙළඳ නගර දෙකකි (2) වෙළඳ සංවිධාන බහුල වූ ප්‍රදේශ දෙකකි

(3) වෙළඳ ශ්‍රේණි සිටි ප්‍රදේශයකි (4) විදේශීය වෙළඳාම සිදු කළ ස්ථාන දෙකකි

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වල රූප සටහන් කිහිපයක් ඇත. ඒවා කුමන කාර්යයක් සඳහා උපයෝගී කර ගන්නේ දැයි ඉදිරියෙන් ලියා දක්වන්න.**

16  ..............................................................................

17  ..............................................................................

18  ..............................................................................

19  ..............................................................................

20  ..............................................................................

**07 ශ්‍රේණිය** **ඉතිහාසය - II කොටස**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01. (1) අනුරාධපුර රාජ්‍ය සමයේ අවසාන භාගයේ රජකල පහත දැක්වෙන රජවරුන් තිදෙනාගේ යුගයේ සිදුවූ කටයුතු අනුව අදාල වන රජවරුන් ලියා දක්වන්න.

(I සේන රජු / මානවම්ම රජු / II සේන රජු)

A - ඉන්දියාවේ පල්ලව රාජධානියේ I නරසිංහ වර්මන් රජුට හිතවත්ව සේවය කිරීම.

B - ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු ලංකාව ආක්‍රමණය කර ලංකා හමුදාව පරාජය කිරීම.

C - හත්ථදාඨ රජු පරාජයට පත් කර බලයට පත්වීම.

D - පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කර පාණ්ඩ්‍යය හමුදාව පරාජය කිරීම

E - රිටිගල ආරාමය ආශ්‍රිත නව ඉදිකිරීම් කිරීම.

F - මිහින්තලේ රෝහලක් ඉදිකිරීම. (ල. 6)

(2) අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන සංවිධානයට අනුව පහත සඳහන් තනතුරු දැරූ පුද්ගලයින්ගේ නම් අනුව ගැලපෙන පිළිතුර වරහනින් තෝරා ඉදිරියෙන් ලියන්න.

A - ඈපා | B - අති අදෙක

C - යුවරජු | D - මාපා

E - ගම්ලද්දන් | F - රට්ඨ

G - චතුරංගනී සේනාව | H - අදෙක (ල. 8)

(මහා ආදිපාද / ආදිපාද / හස්ති අධ්‍යක්‍ෂ/ අධ්‍යක්ෂ / ඇත් අස් රිය පාබල සේනාව / පරිපාලන ප්‍රදේශ / ගම් පාලකයින් / අනාගත රජකම උරුම රජු)

(3) ශ්‍රී ලංකාව සමග අතීතයේ විදේශ වෙළඳාමට සම්බන්ධ වූ රටවල් 02 ක් දක්වන්න. (ල. 2)

02. (1) අතීතයේ පැවති හේන් පිළිබඳව තොරතුරු කීපයක් මෙහි දැක්වේ. එම කාර්යයන් අනු පිළිවෙලින් සකසන්න.

1. නව දූලි හේන සැකසීම | 2. සුදුසු බිම තෝරා ගැනීම

3. දඬු වැට නැගීම | 4. පැල් රැකීම

5. කටුසර භෝග වගා කිරීම | 6. අස්වැන්න නෙලා ගැනීම

7. හේන් බිම කැලෑවක් බවට පත් කිරීම (ල. 7)

(2) අතීතයේ හේන් වල වගා කළ වී වර්ග දෙකක් දක්වන්න. (ල. 2)

(3) අතීත හේන් ගොවියා ගිනි යාතිකාව පැවැත්වීමට හේතුව දක්වන්න. (ල. 2)

03.



(1) මෙම පින්තූරයෙන් අතීත ගොවියා භාවිතා කළ නිර්මාණයක් දැක් වේ. එය නම් කරන්න. (ල. 2)

(2) මෙම නිර්මාණය කුමක් සඳහා භාවිතා කරන ලද්දේ දැයි සඳහන් කරන්න. (ල. 3)

(3) (i) ඉන් ලැබූ ප්‍රයෝජන 02 ක් ලියන්න. (ල. 4)

(ii) පැරණි ගොවියා " ගොයම් කොළය" නිර්මාණය කරන ලද්දේ කෙසේ ද? (ල. 2)

04. අතීත ජනතාවගේ විවිධ අවශ්‍යතා සඳහා කර්මාන්ත බිහි කරගෙන තිබිණි.

(1) මෙහි දැක්වෙන්නේ එවැනි කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන කීපයකි. මේවා නිර්මාණය කළ ශිල්පීන් නම් කරන්න.

- නඟුලත
- හිස පලඳනා
- තඹ නිර්මාණ
- මාල
- රෙදි පිළි
- මැණික් කැපීම
- වළං
- දෑකැත්ත

(ල. 4)

(2) අභ්‍යන්තර වෙළඳාමේ දී අතීතයේ "නිගම" ලෙස හැඳින්වූ ස්ථාන 02 ක් දක්වන්න. (ල. 4)

(3) මෙහි දක්වා ඇත්තේ වෙළඳාම සඳහා යොදාගත් දෙයකි. එය නම් කර එය හමු වූ ස්ථානය දක්වන්න. (ල. 3)



05 (1) පුරා විද්‍යාත්මක කැණීම් වලින් හමු වූ ඉහත භාණ්ඩ තුලින් අපට හෙළිකර ගත හැකි කරුණු දෙකක්දක්වන්න. (ල. 4)



(2) ගොඩවාය හා ගෝකණ්ණ වැනි වරායන් පැරණි ජනතාවට වැදගත් වීමට හේතු 02 ක් ලියන්න. (ල. 4)

(3) පහත දක්වා ඇති ශ්‍රී ලංකාවේ අතීත විදේශ වෙළඳාමට සම්බන්ධ තොරතුරු ඇසුරින් විදේශ වෙළඳාම පිළිබඳව කරුණු 01 බැගින් ලියන්න.

- භාතිකාභය රජු
- චීන මූලාශ්‍ර
- ගොඩවාය

(ල. 3)

06 (1) වසර 50 ක් තුලදී ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර දේශපාලන ගැටුම් උත්සන්න වූ අවධියක ක්‍රි. ව. 684 දි රජ වූ රජු නම් කරන්න. (ල. 2)

(2) එම රජු අප රටේ දේශපාලන ස්ථාවරත්වය ඇති කිරීම සඳහා කළ කටයුතු 2ක් ලියන්න. (ල. 4)

(3) I වන සේන රජු පිළිබඳව පහත දැක්වෙන වගන්ති සිදුවීම් වල අනුපිළිවෙලින් සකසන්න.

⋆ ලංකාවට පාණ්ඩ්‍ය ආක්‍රමණයක් එල්ල වීම ⋆ ආරක්ෂාව පතා මලය දේශයට යෑම

⋆ පාණ්ඩ්‍ය රජු හා I වන සේන රජු අතර සාම ගිවිසුමක් ඇතිවීම

⋆ ශ්‍රී මාර ශ්‍රී වල්ලභ පාණ්ඩ්‍ය රජු I වන සේන පරාජයට පත් කිරීම

⋆ පාණ්ඩ්‍ය ආක්‍රමණය තුලින් ලංකාවේ වටිනා වස්තුව කොල්ල කෑම (ල. 5)

07. (1) අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලනය පිළිබඳව දැක්වෙන පහත සටහන දී ඇති තොරතුරු මගින් සම්පූර්ණ කරන්න.

රජු

↓

(1) ..................................................

↓

සේනාධිපති | 2. .............................. | මහා ලේඛක

↓

අදෙක

↓

අග අදෙක | (3) ..................................

(ඇපා, මාපා, අති අදෙක, යුවරජු, රට ලද්දන්, භාණ්ඩාගාරික) (ල. 3)

(2) අනුරාධපුර යුගයේ සිටි රජවරුන් තම පාලන කාලය තුළ පහත කාර්යයන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා ඇත. ඒවා සඳහා උදාහරණ එක බැගින් දක්වන්න.

A - රටේ ආරක්ෂාව සැලසීම

B - නීතිය හා සාමය පවත්වා ගැනීම

C - ආර්ථික ශුභ සිද්ධිය ඇති කිරීම

D - ශාසනික අභිවෘද්ධියට කටයුතු කිරිම (ල. 4)

(3) අනුරාධපුර යුගයේ ලියන ලද පහත සඳහන් ලේඛන වල අඩංගු දෑ එක බැගින් දක්වන්න.

A - මිහින්තලා පුවරු ලිපිය

B - පඤ්චිකා පොත

C - වේවැල් කැටිය ශිලා ලිපිය

D - අන්තානි කණු (ල. 4)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. හේන් වගාව 02. පිට බිම් 03. ඇල් වී 04. වාපි ගම්ක 05. තෝනිගල 06. ( × ) 07. ( × )
08. ( × ) 09. ( ✓ ) 10. ( ✓ ) 11. ( 2 ) 12. ( 4 ) 13. ( 3 ) 14. ( 2 ) 15. ( 1 )
16. විදේශ වෙළඳාමේදී ගනුදෙනු සඳහා 17. යකඩ උණු කිරීමට 18. වළං සෑදීමට 19. අස්වනු නෙලීමට
20. හැලි කටා / පඹයා වගාවේ ආරක්ෂාවට

(2 x 20 = ල. 40)

## II කොටස

01. 1. A මානවම්ම රජු B I සේන රජු C මානවම්ම රජු
D II සේන රජු E I සේන රජු F II සේන රජු (ල. 6)
2. A - ආදිපාද B - හස්ති අධ්‍යක්ෂ C - අනාගත රජකම උරුම රජු
D - මහා ආදිපාද E - ගම් පාලකයින් F - පරිපාලන ප්‍රදේශ
G - ඇත් අස් රිය පාබල සේනාව H - අධ්‍යක්ෂ (ල. 8)
3. ඉන්දියාව, චීනය, රෝමය, අරාබිය, පර්සියාව. (ල. 2)

02. 1. පිළිවෙලින් දක්වා තිබීම. 2, 1, 3, 5, 4, 6, 7 (ල. 7)
2. ඇල් වී, බිබිළි ඇල්, රත් ඇල් ආදිය..... (ල. 2)

03. 1. වී බිස්ස (ල. 2)
2. කුඹුරෙන් ලබා ගත් අස්වැන්න ආරක්ෂා සහිතව තබා ගැනීම සඳහා (ල. 3)
3. 1. වී ආරක්ෂා කර ගැනීම / වී විනාශ නොවීම / කෘමින්ගෙන් ආරක්ෂා වීම / පරිසර හිතකාමීව තැන්පත් කිරීම(ල. 4)
2. කපාගත් ගොයම් එකතු කොට සකස් කර ගත් ගොයම් ගොඩ මගිනි. (ල. 2)

04. 1. සුදුසු පරිදි නම් කිරීමට (ල. 4)
2. මාගම, අනුරාධපුරය (ල. 4)
3. ගස් එබූ කසාපණ කාසිය / අම්පාර (ල. 3)

05. 1. ● චීනය සමග විදේශ සබඳතා පැවැත්වීම ● විදේශ භාණ්ඩ අප රටේ පරිහරණය
● ඉතා අලංකාර භාණ්ඩ අතීතයේ නිෂ්පාදය (ල. 4)
2. ⋆ ස්වාභාවික වරායන් වීම ⋆ අවට රටවල් සමඟ සබඳතා පැවැත්වීමට / වෙළඳ භාණ්ඩ ආනයනයට හා අපනයනයට (ල. 4)
3. ● භාතිකාභය රජු - රුවන්වැලිසෑය අලංකාර කිරීම ● චීනමුලාශ්‍ර - ශ්‍රීලංකාවේ නැව් චීනයේ නවතා තැබීම
● ගොඩවාය - භාණ්ඩ පැටවීම හා ගොඩබෑම සිදු වූ ස්ථානයකි. (ල. 3)

06. 1. මානවම්ම රජු (ල. 2)
2. දිගු කලක් පැවති දේශපාලන වියවුල් සමථයකට පත් කිරීම, වසර 50 ක් පමණ රටේ පැවති දේශපාලන ගැටුම් ඉවත්කර රජවීම, විදේශ ආක්‍රමණ වැලැක්වීම (ල. 4)
3. (1) ලංකාවට පාණ්ඩ්‍ය ආක්‍රමණය එල්ලවීම
(2) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ I සේන පරාජය කිරීම
(3) ආරක්ෂාව පතා මලය දේශයට යෑම
(4) I සේන හා පල්ලව රජු අතර සාම ගිවිසුම
(5) පාණ්ඩ්‍ය ආක්‍රමණ තුලින් ලංකාවේ වටිනා වස්තුව කොල්ල කෑම (ල. 5)

07. 1. (1) යුවරජු (2) භාණ්ඩාගාරික (3) අති අදෙක (ල. 3)
2. A, B, C, D } ලියාඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 4)
3. A - මුල්‍ය කලමනාකරණය
B - විහාරයේ වැඩ කටයුතු
C - දසගම් පාලනය , අපරාධ හා නඩු විසඳීම
D - රාජකීය දීමනා ගැන ඇත.